 බ.කො.චක්‍රලේඛ අංක - 07 /2018

මගේ අංකය - කේ09/විවිධ/ /2018.

බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.

2018.02.05 දින.

සියළුම බන්ධනාගාර අධිකාරී/සහකාර බන්ධනාගාර අධිකාරී වෙත,

<u>ඩෙංගු රෝගය මර්දනය කිරීමේ ජනාධිපති වැඩසටහන.</u>

ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා අතිගරු ජනාධිපති තුමාගේ නියමයෙන් හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි මා විසින් 2017.10.09 දින නිකුත්කරන ලද චක්‍රලේක අංක 18/2017 අනුව ඔබ විසින් ක්‍රියාත්මක කරනලද වැඩසටහන් පිළිබඳව ස්තුතිය පලකරමින් ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහත්මා විසින් ලිපියකින් දන්වා එවා ඇත. (ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත) එකී ලිපියේ සඳහන් පරිදි පසුගිය වසරේ ක්‍රියාත්මක කල ඩෙංගු මර්දන වැඩසටහන් වලින් රෝග ව්‍යාප්තිය අඩුවීමක් දක්නට ඇතත්, එය සැලකිය යුතු මට්ටමකට පැමිණ නැති බැවින් හා වර්ෂා කාලය පැමිණීමත් සමඟම නැවත රෝගය ව්‍යාප්ත වීමට ඉඩකඩ ඇති නිසා එම පිරිසිදු කිරීම් 2018 දෙසැම්බර් මස 31 දක්වා ක්‍රියාත්මක කලයුතු බව දන්වා ඇත.

එබැවින් බන්ධනාගාර නිලධාරීන්ගේ හා නේවාසිකයන්ගේ සෞඛ්‍යාරක්ෂක ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිටත අනුමත නේවාසිකයන් යොදවා ඩෙංගු ව්‍යාප්ත වන ප්‍රදේශ පවිත්‍ර කිරීමට ක්‍රියාකල යුතුවේ. ඊට අදාලව පහත සඳහන් ක්‍රියාමාර්ගයන් ඔබ විසින් අනුගමනය කලයුතු බව දැනුම් දෙමි.

1/. සෑම සති අන්තයකදීම ආයතනය ඇතුලත හා (නිලනිවාස/අවිවාහක නිලනිවාස) අවට පරිශ්‍රයන් පිරිසිදුකිරීමට කෙටි කාලීන නේවාසිකයන් යෙදවීමට කටයුතු කිරීම.

2/ඔබ ආයතනයට ආසන්න ප්‍රදේශයේ ඩෙංගු බෝවන ස්ථාන පිලිබඳව සොයාබලා එම ස්ථාන ඔබ ආයතනයේ මූලිකත්වය ඇතුව පිරිසිදුකිරීම සඳහා නේවාසිකයන් යෙදවීමට (අවදානම් සහිත) සුදුසු ස්ථානයක්ද යන්න පිලිබඳව ජේලර්වරයකු හෝ පුනරුත්ථාපන නිලධාරී වරයකු යොදවා වාර්තාවක් ලබා ගෙන එම වාර්තාව හා ඔබගේ නිර්දේශය සමඟින් මූලස්ථානය වෙත යොමුකර අනුමැතිය ලබාගැනීම.

4/වැඩසටහන අවසන් වන 2018.12.31 දිනෙන් පසු අදාල ශ්‍රමදාන වල ප්‍රගතිය සඳහන් විස්තර වාර්තාවක් මූලස්ථානය වෙත යොමුකිරීම.

මෙකී කාලය තුලදී මෙය ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා ඔබගේ පෞද්ගලික අවධානය යොමුකර මෙම වැඩසටහන නොකඩවා 2018.12.31 දක්වා ක්‍රියාත්මක කිරීමට පියවර ගන්න.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

එච්.එම්.එන්.සී.ධනසිංහ

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත - ලේකම්, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය, කාලවිල් පෙදෙස, කොළඹ 03. (ගරු අමාත්‍යතුමාගේ දැනගැනීම හා අවදානය සඳහා)